**GMOA**

ESTABLISHED IN 1926
TU No. 291

**THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION**

No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2012-09-11

## මාධ්‍ය නිවේදනයයි

කොළඹ ප්‍රධාන පෙලේ පෞද්ගලික රෝහල් කිහිපයක සුදුසුකම් නොලත් ඉන්දිය වෛද්‍යවරු 180 කට අධික සංඛ්‍යාවක් විශේෂඥ වෛද්‍යවරුන් ලෙස යොදවා ඇති අතර ඔවුන්ගේ සුදුසුකම් පරික්ෂා කර බලා බඳවා ගැනීම සඳහා ප්‍රමිතියක් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ මැදිහත්විමෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලදි. එසේ පරික්ෂා කිරීමේදි වෛද්‍යවරු බෙහෝමයක් ප්‍රමිතියෙන් තොර බව අනාවරණය වූ අතර ඔවුන් දිගටම සේවයේ රඳවා ගැනීමට පෞද්ගලික රෝහල් හිමියන් දේශපාලඥයින් හරහා සෞඛ්‍ය අමාත්‍යංශයට බලපෑම් කිරීමට පටන් ගෙන ඇත. ඊට අමතරව මේ වෛද්‍යවරුන් සඳහා නිතිමය ආවරණයක් ලබා ගැනීමට අධිකරණ ක්‍රියා මාර්ගයකට යාමටද පෞද්ගලික රෝහල් හිමියන් සැරසෙන බව වාර්තා වී ඇත.

රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය මෙම සදාචාරාත්මක නොවන ක්‍රියාව තරයේ හෙලා දකින අතර ශ්‍රී ලාංකික රෝගින්ගේ ජිවිත අවදානමට ලක් කිරිමට පෞද්ගලික රෝහල් හිමියන්ට හෝ වෙනත් කිසිදු බලවේගයකට ඉඩ නොතබන බව අවධාරනය කර සිටී. අවශ්‍යය වුවහොත් රෝගි අයිතිවාසිකම් වෙනුවෙන් අධිකරණ ක්‍රියාමාර්ගයකට වුවද එළඹීමට රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය සූදානමින් සිටියි. රජය මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක කර වීමට නිසි මැදිහත්වීමක් නොකලහොත් ඉදිරියේදි දැඩි වෘත්තිය ක්‍රියා මාර්ගයකට එළඹීමට සිදුවන බව අවධාරණය කරමු.

ස්තුතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

වැඩිදුර විස්තර

වෛද්‍ය නලින් ආරියරත්න : 0714800942
වෛද්‍ය නලින්ද හේරත් : 0717876516
වෛද්‍ය නවීන් සොයිසා : 0718582444